## අධිකරණ සේවා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා අධිකරණ සේවයේ පුරප්පාඩු

**ශ්‍රී ලංකා අධිකරණ සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ අධිකරණ නිලධාරි (මහෙස්ත්‍රාත්) තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

01. අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති තැනැත්තන්, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත අයදුම්පත් භාරගන්නා අවසන් දිනයවන **2025.12.12 දින** හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතු ය. තව ද, සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග අයදුම්කරුගේ ලිපිනය පැහැදිලිව සඳහන් කරන ලද රු. 110 ක (විභාග අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑල මගින් යොමු කිරීම සඳහා) වටිනාකමකින් යුතු මුද්දර අලවන ලද ලියුම් කවරයක් ද අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

**02.** වැටුප් ක්‍රමය : **රු. 131,300-10x2940-රු.160,700**

(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක. 03/2025 අනුව) අධිකරණ නිලධාරින්ට හිමි දීමනා වැටුපට අමතරව ගෙවනු ලැබේ.

**03.** **සෑම අයදුම්කරුවෙක් ම :**

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය;
(ආ). විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය;
(ඇ). ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

**04.** **සුදුසුකම් :**

(අ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු තුනකට නොඅඩු කාලයක් ක්‍රියාකාරී වෘත්තියෙහි යෙදී සිටින හෝ යෙදී සිටි නීතිඥවරයකු වීම;

*හෝ*

(ආ). අයදුම්පත් භාරගන්නා අවසන් දිනට නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දී වසර තුනකට නොඅඩු සේවා කාලයක් ඇති ශ්‍රේෂ්ඨාධිකරණයේ/ අභියාචනාධිකරණයේ නීති පර්යේෂණ නිලධරයකු ලෙස සේවය කර ඇති නීතිඥවරයකු වීම;

*හෝ*

(ඇ). අයදුම්පත් භාරගන්නා අවසන් දිනට යම් අමාත්‍යාංශයක, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් රජයේ ආයතනයක අවුරුදු තුනකට නොඅඩු කාලයක් නීති නිලධරයකු ලෙස සේවය කර ඇති සහ එම කාලය තුළ නිරතුරුවම අධිකරණය ඉදිරියේ පෙනී සිටි නීතිඥවරයකු වීම;

*හෝ*

(ඈ). අයදුම්පත් භාරගන්නා අවසන් දිනට යම් සමාගමක හෝ බැංකුවක හෝ ආයතනයක නීති නිලධරයකු ලෙස අවුරුදු තුනකට නොඅඩු කාලයක් සේවයකර ඇති සහ එම කාලය තුළ නිරතුරුවම අධිකරණය ඉදිරියේ පෙනී සිටි නීතිඥවරයකු වීම.

*සැ. යු. :* ඉහත (අ.), (ආ.), (ඇ.) සහ (ඈ.) යන ඡේදයන් හි සඳහන්කර ඇති "අවුරුදු තුනකට නොඅඩු" සේවා කාලය/ ක්‍රියාකාරි වෘත්තිය කාලය ගණනය කිරීමේ දී, ඉහත (අ.), (ආ.), (ඇ.) සහ (ඈ.) හි සඳහන් සේවා කාලයන්/ ක්‍රියාකාරි වෘත්තිය කාලයන් හි සංකලනයන් ද සලකා බැලේ.

05. සියලුම අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එහි ප්‍රතිඵල මත සම්මුඛ පරීක්ෂණයකට / පරීක්ෂණවලට කැඳවනු ලැබේ.

*සටහන :*

01. අයදුම්පත් ගාස්තුව රු. 15,000/- කි. එම මුදල මහජන බැංකුවේ, වේල්ල වීදිය ශාඛාවේ පවත්වාගෙන යනු ලබන අංක. 297100199025039 දරන "ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව" යන ගිණුමට බැර වන සේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් මුදල් ගෙවා ලබාගත් ලදුපත ලියාපදිංචි තැපැල් මගින් හෝ පෞද්ගලිකව පැමිණ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයට ලැබීමට සැලැස්වීමෙන් අයදුම්පත් ලබා ගත හැක. මුදල් ගෙවීම සඳහා අදාළ ලදුපත සම්පූර්ණ කිරීමේ දී ලදුපතේ අදාළ ස්ථානයේ අයදුම්කරුගේ නම සහ ලිපිනය සටහන් කළ යුතු ය.

02. සිය අයදුම්පත ලබා ගැනීම සහ සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාරදීම ලියාපදිංචි තැපැලෙන් හෝ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත පෞද්ගලිකව පැමිණ සිදුකළ යුතු වේ.

03. රජයේ සේවයේ නියුක්තව සිටින නිලධාරීන් සිය අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් පමණක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් ලබා ගැනීම සහ ඉදිරිපත් කිරීම සඳහා ලිපිනය :

ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,
කොළඹ 12.

**ප්‍රසන්න අල්විස්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2025 නොවැම්බර් මස 13 දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

11 - 313